**මධ්‍යම පළාත් තාක්ෂණ සහායක තනතුරේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ**
**විවෘත තරඟ විභාගය - 2018**

1. මධ්‍යම පළාත් තාක්ෂණ සහායක තනතුරේ III ශ්‍රේණියේ තනතුරු 08ක් සඳහා බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය සඳහා සුදුසුකම් ලත් මධ්‍යම පළාතේ පදිංචිකරුවන්ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

2. මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල අනුව, කුසලතාව මත සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයින් මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සහායක තනතුරේ III ශ්‍රේණියේ තනතුරු සඳහා පත්කිරීමට තෝරා ගනු ඇත.

3. වයස් සීමාව:

   ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 නොඅඩු සහ 35ට නොවැඩි විය යුතුය. දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු වූවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

4. අධ්‍යාපන සුදුසුකම්:

   භාෂාව හා සාහිත්‍ය, ගණිතය හා විද්‍යාව ඇතුළුව විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය එක්වරකදී සමත්වීම.

5. වෘත්තීය සුදුසුකම්:

   ඉහත අංක: 04 හි අධ්‍යාපන සුදුසුකම් සහිතව ජාතික වෘත්තීය සුදුසුකම්වල (**NVQ**) 05 වන මට්ටමේ රජයේ පිළිගත් තාක්ෂණ / කාර්මික විද්‍යාලයකින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණ (සිවිල් ඉංජිනේරු) සහතිකය ලබා තිබීම

6. වෙනත් සුදුසුකම්:

   (අ). ශ්‍රී ලාංකික පුරවැසියෙකු වීම.

   (ආ).විශිෂ්ඨ චරිතයකින් යුක්ත වීම.

   (ඇ).අයැදුම්කරු මධ්‍යම පළාත් බල ප්‍රදේශය තුළ අයැදුම්පත් කැඳවන අවසන් දිනයට පූර්වාසන්නයේ නොකඩවා වසර 03ක් ස්ථිර පදිංචිය සනාථ කළ යුතුය.

7. වැටුප් පරිමාණය:

   රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3/2016 යටතේ MT1-2016

   රුපියල්: 29,840/- – 300*x*10- 350*x*11 – 560*x*10 – 660*x*10 – 48,890/-

   රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3/2016 දරන චක්‍රලේඛයේ උපලේඛන අංක: II හි සඳහන් පරිදි 2018 වර්ෂයට අදාළව රුපියල් 23,674/-ක වැටුප් තලයක පිහිටුවා වැටුප් ගෙවනු ලැබේ.

   **III** වන ශ්‍රේණියට පත්වීම් ලබා වසර 03ක් ගතවීමට පෙර පළමුවන කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුතුය. පත්වීම ලැබ වසර 05ක් ගතවීමට පෙර 2014.01.21 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 01/2014 පරිදි අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතාවය ලබාගත යුතුය.

8. සේවා කොන්දේසි:

   i. මෙම තනතුර ස්ථිර වන අතර, විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට ඔබ යටත් විය යුතුය.

   ii. තෝරාගනු ලබන ඉල්ලුම්කරුවන් මධ්‍යම පළාතේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පුරප්පාඩු පවති ආයතන වෙත අනුයුක්ත කරනු ඇත.

   iii. මෙම තනතුරට පත්කිරීමෙන් අනතුරුව මධ්‍යම පළාත තුළ වසර 05ක අවම සේවා කාලයක් අනිවාර්යයෙන් සේවය කළ යුතු අතර එම කාලය තුලදී මධ්‍යම පළාතෙන් පිටතට ස්ථානමාරු ලබා ගැනීමට හෝ වෙනත් තනතුරකට මුදාහැරීමට සිදුකරනු ලබන කිසිදු ඉල්ලීමක් සලකා බලනු නොලැබේ. තවද පත්කරනු ලබන සේවා ස්ථානයේ වැඩ භාරගත් දින සිට අවුරුදු 03ක අවම සේවා කාලයක් අනිවාර්යයෙන්ම සේවය කළ යුතුය.

   iv. තොරාගනු ලබන අයැදුම්කරුවන් ආයතන සංග්‍රහයේ, මුදල් රෙගුලාසිවල සඳහන් විධිවිධානවලට අනුව රජය හා මධ්‍යම පළාත් සභාව විසින් නිකුත් කරනු ලබන චක්‍රලේඛ නියෝග හා දෙපාර්තමේන්තු උපදෙස්වලට යටත්ව කටයුතු කිරීමට බැඳී සිටී.

9.
(I).බඳවා ගැනීමේ ක්‍රමය:

රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ 15/90 හි විධිවිධාන පරිදි දිස්ත්‍රික් ජනගහණ අනුපාතය අනුව ඉහත පවත්නා පුරප්පාඩු සඳහා බඳවාගත් ලැබේ. මේ සඳහා මධ්‍යම පළාත් රජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයකින් අනතුරුව එම ලිඛිත පරීක්ෂණයෙන් ලබාගන්න ලකුණු ප්‍රමුඛතාවය මත සුදුස්සන් තෝරා ගැනේ. සම්මුඛ පරීක්ෂණයේදී ලකුනු ලබාදීමක් සිදු නොවන අතර ලිඛිත විභාගයේදී එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා 40% අවම ලකුණු ප්‍රමානයක් ලබා නොගන්නා ඉල්ලුම්කරුවන් බඳවා ගැනීම සඳහා සලකා බලනු නොලැබේ.

(II) විභාග ක්‍රමය:

(අ) විභාගය සිංහල, දෙමළ, ඉංග්‍රිසි මාධ්‍යවලින් පවත්වනු ලැබේ. ඉල්ලුම් කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

(ආ) අපේක්ෂකයා විභාගයේදී පෙනී සිටින සියළුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පිළිතුරු සැපයිය යුතුය.

(ඇ) විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ.

(III) විභාගයේ විෂයන්:

විභාගය ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ.

1. බුද්ධි පරීක්ෂණය.
2. තාක්ෂණික ප්‍රශ්න පත්‍රය.

10. විෂය නිර්දේශය:

1. බුද්ධි පරීක්ෂණය.
   කාලය පැය 01 කි.
   මුළු ලකුණු 100 යි.

අපේක්ෂකයාගේ සිතිමේ තර්කානුකුලතාවයත් ඔහුගේ සිතිමේ විශ්ලේෂණ තත්ත්වයත් තීරණය කිරීම, විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්න වලින් යුක්තය.

2. තාක්ෂණික ප්‍රශ්න පත්‍රය.
   කාලය පැය 03 කි.
   මුළු ලකුණු 100 යි.

ගොඩනැගිලි ඉදිකිරීමේ මූලධර්ම, ඉදිකිරීමේ කාර්ය සඳහා පිඹුරුපත් සකස් කිරීම හා කියවා වටහා ගැනිම, ජල සැපයීම, ජල ප්‍රවාහන ක්‍රියා මාර්ග හා අපද්‍රව්‍ය බැහැර කිරීමේ ක්‍රියා පිළිවෙල පිළිබඳව අපේක්ෂකයා සතු දැනුම විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්න වලින් යුක්ත වේ.

ඉහත එක් එක් ප්‍රශ්න පත්‍රයට 40% ක් හෝ ඊට වැඩි ලකුණු ලබාගත් ඉල්ලුම්කරුවන් තෝරා ඔවුන්ගේ එම ලකුණු ප්‍රමාණවල එකතුව අනුව බඳවා ගැනීම සඳහා වූ ප්‍රමුඛතා ලේඛනය සකස් කෙරේ.

11. ව්‍යාජ තොරතුරු සඳහා දඩුවම්:

ඉල්ලුම්පත්‍රය පිරවිමේදී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මේ විභාගයේ නීතිරීති අනුව යම් අපේක්ෂකයෙකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙද්දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවකදී ඔහුගේ/ ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය.

ඉල්ලුම්කරුවෙකු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඕනෑම අවස්ථාවක අසත්‍ය බව පෙනී ගියහොත් හෝ ඔහු/ඇය මධ්‍යම පළාත් රාජ්‍ය සේවයෙන් පහකිරීමට පිළිවන. අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු/ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

12. විභග ගාස්තු:

විභාග ගාස්තු රු:600/-කි. මෙම මුදල මධ්‍යම පළාතේ ප්‍රධාන ලේකම්ගේ ආදායම් ශීර්ෂ 20-03-02-13 ට බැරවෙන පරිදි මධ්‍යම පළාත තුළ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගෙවිය හැකිය. ඒ සඳහා නිකුත් කරන රිසිට්පත ඉල්ලුම්පතේ අදාළ කොටුවේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. ( රිසිට්පතේ ඡායාස්ථ පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළග තබාගත යුතුය.) කිසිම හේතුවක් නිසා වත් විභාග ගාස්තු ආපසු ගෙවනු නොලබන අතර, මුදල් ඇණවුම් හා මුද්දර භාරගනු නොලැබේ.

13. අයැදුම්පත් පිරවීම සඳහා උපදෙස්:

ආදර්ශ අයැදුම්පත් ආකෘතියට ප්‍රකාර ඒ 4 ප්‍රමාණයක කඩදාසිය දෙපැත්තම භාවිතා කරමින් එහි පළමු පිටුවෙහි අංක **1-3** දක්වා කරුණු ද අනෙක් පිටුවල ඉතිරි ඡේදද ඇතුළත්වන සේ සකස් කර ගත යුතුය. අයැදුම්පත්‍රය යතුරු ලියනය කර ගැනීමෙන් හෝ පැහැදිලි අත් අකුරින් සකස් කර ගත යුතුය. අයැදුම්පත්‍රය පිරවීමේදී පහත දැක්වෙන සංකේත අංක නියමිත කොටුවල පැහැදිලිව සඳහන් කළ යුතුය

13.1 අයැදුම් කරන දිස්ත්‍රික්කය ලෙස සඳහන් කළ යුත්තේ අයැදුම්කරුගේ ස්ථිර පදිංචිය ඇති දිස්ත්‍රික්කයට අදාළ සංකේත අංකයයි:

මහනුවර - 01
මාතලේ - 02
නුවරඑළිය - 03

13.2 ආදර්ශ ඉල්ලුම්පත්‍රය www.psc.cp.gov.lk වෙබ් අඩවියෙන් භාගත හැක.

13.3 විභාගය සඳහා වන සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍රය ලියාපදිංචි තැපැලෙන් 2018 ජූලි 15 දින හෝ ඊට පෙර පහත ලිපිනයට එවිය යුතුය.

**"ලේකම්, මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,**
**අංක: 244, කටුගස්තොට පාර,**
**මහනුවර."**

ඉල්ලුම්පත්‍රය බහාලන කවරයේ වම්පස ඉහළ කෙලවරේ " මධ්‍යම පළාත් තාක්ෂණ සහායක තනතුරේ III ශ්‍රේණියේ තනතුරට නිලධාරීන් බඳවා ගැනීම - 2018" යනුවෙන් සඳහන් කළ යුතුය.මෙදිනට පසුව ලැබෙන කිසිම ඉල්ලුම්පතක් භාරගනු නොලැබේ.

13.4 දැනටමත් මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ සිටින නිලධාරීන් ඉල්ලුම්පත්‍රයේ අංක: 12.0 ශීර්ෂය යටතේ තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් සහතික කරන ලද ඉල්ලුම්පත ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

13.5 අයැදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්වයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු හෝ ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු හෝ රු 240360/- කට වැඩි වාර්ෂික වැටුපක් ලබන රජයේ/පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිළධාරියකු විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.

13.6 යම් අයැදුම්කරුවෙකුට සුදුසුකම් නොමැති බව පත්වීම් ලැබීමට පෙර හෝ පත්වීම් ලබා දීමෙන් පසු හෝ ඕනෑම අවස්ථාවකදී අනාවරණය වුවහොත් අපේක්ෂකත්වය හෝ පත්වීම අවලංගු කෙරෙනු ඇත. එසේම දැන දැනම සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව හෝ නිරවද්‍ය තොරතුරු ඕනෑකමින් යටපත්කර ඇති බව හෝ අනාවරණය වුවහොත් සේවයෙන් පහ කෙරෙනු ඇත.

14. මෙම විභාග පැවැත්වීම පිළිබඳව හෝ පැවැත්වීමෙන් පසුව තෝරා ගැනීම් කිරීම / නොකිරීම හෝ පුරප්පාඩු සංඛ්‍යාව පිළිබඳව අවසාන තීරණය මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුය. එසේම මෙම නිවේදනයේ විධිවිධාන සලසා නැති කිසියම් කරුණක් වෙතොත් ඒ ගැන පැහැදිලි කිරීම / තීරණය කිරීම මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

2018 ජූනි මස 11 වෙනි දින,
මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
අංක 244, කටුගස්තොට පාර,
මහනුවර.

ආර්.එම්.එන්. රත්නායක,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
මධ්‍යම පළාත් සභාව.